ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය
---------------------------------

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 23 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු27 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2014 දෙසැම්බර් 11 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 <u>මතය</u>

මෙම වාර්තාවේ 1.3.3, 1.3.5 හා 1.3.6 ඡේදයන්හි දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ). සමීක්ෂණ වාර්තා අනුව සමාලෝචිත වර්ෂය අවසානයට පුස්තකාල පොත් ශේෂය රු.6,017,816 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවලට එය රු.10,640,537 ක් ලෙස රු.4,622,721 ක් වැඩියෙන් ගෙන තිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂය තුල පුස්තකාල පොත් මිලදී ගැනීම් හා පරිත්‍යාග රු.145,560 ක් ගිණුම් ගතකර නොතිබුණි.

(ඇ). වර්ෂයට අදාල රු.18,286,108 ක කර්මාන්ත ණයගැති ශේෂය ගිණුම් ගත නොකිරීම නිසා ප්‍රාග්ධන ලැබීම් හා කර්මාන්ත ණයගැතියන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ). සමාලෝචිත වර්ෂය අවසානයට බදුකුලී (5/23) බිල්කිරීම රු.6,747,440 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවලට එය රු.5,866,042 ක් ලෙස රු.881,398 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ). සමාලෝචිත වර්ෂයට අදාල කඩකුලී (5/22) බිල් කිරීම රු.879,000 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවලට එය රු.1,143,698 ක් ලෙස රු.264,698 ක් වැඩියෙන් ගෙන තිබුණි.

(ඊ). වර්ෂයට අදාල වරිපනම් බදු (1/11) බිල්කිරීම රු.1,896,116 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවලට එය රු.3,558,915 ක් ලෙස රු.1,662,799 ක් වැඩියෙන් ගෙන තිබුණි.

(උ). සමාලෝචිත වර්ෂයට අදාල අක්කර බදු (1/12) බිල්කිරීම රු.86,933 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවලට එය රු.251,814 ක් ලෙස රු.164,881 ක් වැඩියෙන් ගෙන තිබුණි.

(ඌ). වර්ෂයට අදාල උසාවි දඩ (1/52) ආදායම රු.2,414,205 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවලට එය රු.1,926,286 ක් ලෙස රු.487,919 ක් අඩුවෙන් ගෙන තිබුණි.

(එ). සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ උසාවි දඩ ආදායම රු.437,916 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවලට එය රු.2,414,205 ක් ලෙස රු.1,976,289 ක් වැඩියෙන් ගෙන තිබුණි.

(ඒ). සාවද්‍ය ගැලපීම් හේතුවෙන් වර්ෂය අවසානයට උසාවි දඩ ගිණුමේ ශේෂය රු.1,841,938 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඔ). ඉකුත් වර්ෂවලට අදාලව සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබුණු රු.18,444,449 ක්වූ හිඟ මුද්දර ගාස්තු ප්‍රමාණය සමුච්චිත අරමුදලට බැර නොකර වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම් ගිණුමට බැර කිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඕ). පෙර වර්ෂය වෙනුවෙන් ලැබී තිබූ රු.565,012 ක් වූ දේපල ණය පොලී, ශේෂය ජ'නල් සටහන් අංක 22 මගින් අදාල දේපල ණය පොලී ගිණුම බැර කර මුද්දර ගාස්තු ආදායම් (1/64) ගිණුම හර කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම රු.565,012 ක් අඩුවෙන් ගිණුම් ගතව තිබුණි.

(ක). සමාලෝචිත වර්ෂයට අදාල වැටුප් ප්‍රතිපූර්ණ ආදායම රු.28,278,419 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වලට එය රු.27,569,964 ක් ලෙස රු.708,455 ක් අඩුවෙන් ගෙන තිබුණි.

(ග). සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වැටුප් ප්‍රතිපූර්ණය රු.116,500 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වලට එය රු.740,420 ක් ලෙස රු.623,920 ක් වැඩියෙන් ගෙන තිබුණි.

(ච). කර්මාන්ත ණයහිමි උපලේඛනය අනුව සමාලෝචිත වර්ෂයට අදාල කර්මාන්ත ණයහිමි වෙන්කිරීම රු.30,270,230 ක් වුවද, ජ'නල් සටහන් අංක 17 හා 18 මගින් කර්මාන්ත ණයහිමියන් ලෙස රු.25,868,172 පමණක් වෙන්කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාල ප්‍රාග්ධන වියදම (309) හා සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත ණයහිමියෝ රු.4,402,058 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ජ). කර්මාන්ත ලේඛනය අනුව ඉකුත් වර්ෂ වෙනුවෙන් ගෙවිය යුතුව පැවති රු.5,441,225 ක මුදල සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත ණයහිමියන් යටතේ දක්වා නොතිබුණි.

(ට). සමාලෝචිත වර්ෂයේ හතරවන කාර්තුව වෙනුවෙන් ගෙවිය යුතු වූ මුද්දර බද්ද රු.30,690 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවලට එය රු.355,802 ක් ලෙස රු.325,112 ක් වැඩියෙන් ගෙන තිබුණි.

(ඩ). සමාලෝචිත වර්ෂය තුල ජාතිය ගොඩනැගීමේ බදු හා එකතු කල අගය මත බදු ලෙස පිළිවෙලින් රු.80,080 ක් හා රු.385,699 ක් ගෙවා තිබුණද, එම ගෙවීම් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(න). සමාලෝචිත වර්ෂයට අදාලව දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවූ හා ගෙවිය යුතු වාරික මුදල්වල වටිනාකම රු.1,785,264 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවලට එය රු.1,134,353 ක් ලෙස රු.650,911 ක් අඩුවෙන් ගෙන තිබුණි.

(ත). වර්ෂය අවසානයට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතුව පැවති රු.4,544,380 ක දායක මුදල ණයහිමියන් යටතේ දක්වා නොතිබුණු අතර, වර්ෂයට අදාල දායක මුදල වූ රු.130,752 ක ප්‍රමාණය වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ද). සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ වැටුප් ප්‍රතිපූර්ණ ලෙස වැඩියෙන් වෙන්කර තිබුණු රු.1,487,278 ක ප්‍රමාණය සමුච්චිත අරමුදල මගින් ගැලපීම වෙනුවට ජ'නල් සටහන් අංක 24 මගින් වැටුප් ප්‍රතිපූර්ණ ගිණුම හර කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වැටුප් ප්‍රතිපූර්ණ ආදායම රු.1,487,278 ක් අඩුවෙන් ගිණුම්ගතව තිබුණි.

(ණ). සමාලෝචිත වර්ෂය තුල පරිත්‍යාග ලෙස ලැබී තිබුණු ට්‍රැක්ටර් රථයක වටිනාකම ස්ථාවර වත්කම් ලේඛනයෙහි රු.1,463,200 ක් ලෙස දක්වා තිබුණද, ගිණුම්වල එය රු.1,100,000 ක් ලෙස රු.363,200 ක් අඩුවෙන් දක්වා තිබුණි. එසේම එම වටිනාකම සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ආධාර හා ප්‍රාග්ධන වැය ලෙස ගිණුම් ගතකර නොතිබුණි.

1.3.2 <u>අසම්භාව්‍ය බැරකම්</u>

ප්‍රාදේශීය සභාවේ සේවය කර විශ්‍රාම ලබා ඇති පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු සේවකයන්ට අදාලව සභාව විසින් එම අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එම අරමුදලට ගෙවිය යුතු ශේෂය රු.4,544,380 ක්ව තිබුණි .

1.3.3 <u>නොසැසඳු පාලන ගිණුම්</u>

සමාලෝචිත වර්ෂයට අදාලව ආරම්භක ශේෂය, බිල් කිරීම්, ලැබීම් හා අවසාන ශේෂය යටතේ ගිණුම් විෂයයන් 20 කට අදාලව ගිණුම අනුව සහ අදාල ලේඛන අනුව අනුරූපී අගයන් අතර රු .11,636,879 ක නොසැසඳීම් පැවතුණි.

1.3.4 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

(අ). 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.92,745,492 ක් වූ අතර ඒ පිළිබඳ නිවැරදි කාල විශ්ලේෂණ ඉදිරිපත් නොවුණි.

(ආ). 2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂවල වටිනාකම රු.42,782,150 ක් වූ අතර, ඒ පිළිබඳ නිවැරදි කාල විශ්ලේෂණ ඉදිරිපත් නොවුණි.

1.3.5 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම නිසා එකතුව රු .58,494,355 ක ගනුදෙනු පිළිබඳව විස්තරාත්මක පරීක්ෂාවක් කළ නොහැකි විය.

1.3.6 <u>අධිකාරි බලය නොලත් ගනුදෙනු</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). අවස්ථා 11 කදී සමුච්චිත අරමුදලට රු.12,485,360 ක මුදලක් ගලපා තිබුණද ඒ සඳහා විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි. තවද එසේ ගලපා ඇති වටිනාකම් සෑදුම්ලත් ආකාරයද හඳුනාගෙන නොතිබුණි.

(ආ). ගිණුම් විෂයයන් 06 ක ගිණුම හා අදාල උපයෝගී ලේඛන අනුව වූ වටිනාකම්වල නොසැසඳීම් නිවැරදි කිරීම සඳහා රු.4,446,951 ක ගැලපුම් සිදුකර තිබුණද, එම ශේෂ සෑදුම්ලත් ආකාරය හඳුනාගෙන නොතිබුණි. තවද අනුමැතියකින් තොරව ජ'නල් සටහන් මගින් අවස්ථා 6 කදී ලෙජර් ගිණුම් වලට මෙම ගැලපීම් සිදුකර තිබුණි.

02. <u>මූල්‍ය සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.24,172,360 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,827,498 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.19,344,862 ක වර්ධනයක් පැවතුණි. මෙකී මූල්‍ය ප්‍රතිඵලයට රු.59,294,493 ක් වූ ප්‍රාග්ධන ආධාර හා රු.47,614,584 ක් වූ ප්‍රාග්ධන වැය ගැලපූවිට සමාලෝචිත වර්ෂයට අදාල අතිරික්තය රු.35,852,269 ක් දක්වා වැඩිවී තිබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂයට අදාලව සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.95,350,965 න් සියයට 81 ක් ලෙස රු.77,725,444 ක්ම උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම් වලින් සමන්විත විය. එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.59,294,493 ක මුළු ප්‍රමාණයම ගමනැගුම, මගනැගුම, වයඹ පුබුදුව වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මගින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලද මුදල් වලින් සමන්විත විය.

(ආ). සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්තන වියදම වූ රු.71,178,605 න් සියයට 53 ක් ලෙස රු.37,532,736 ක් පඩිනඩි සඳහා වියදම වූ අතර ඉන් සියයට 73 ක් ලෙස රු.27,569,964 ක් වැටුප් ප්‍රතිපූර්ණ වශයෙන් පළාත් පාලන කොමසාරිස් වෙතින් ලැබී වෙනත් ආදායම් යටතේ ගිණුම් ගතකර තිබුණි. එමෙන්ම ප්‍රාග්ධන වියදම වූ රු.47,614,584 න් සියයට 57 ක් ලෙස රු.27,053,043 ක් පමණක් සභා අරමුදල් වැය වූ අතර ඉතිරි සියයට 43 ක් වූ රු.20,561,541 ක ප්‍රමාණය ගමනැගුම, මගනැගුම, වයඹ පුබුදුව වැනි ප්‍රභව මත වෙනත් ආයතන ප්‍රතිපාදන මත ඉටුකල සංවර්ධන කාර්යයන්ගෙන් සමන්විත විය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

වෙළඳ බලපත්‍ර, ව්‍යාපාර බදු, කඩකුලි, බදු කුලී වැනි ආදායම්, ක්ෂේත්‍රයේදි එකතු කිරිම සඳහා නිශ්චිත බලයක් නොතිබුණ ද, සභාවේ ආදායම් එකතු කරන්නන් විසින් වර්ෂය පුරාම වරිපනම් බදු හා වෙළඳ බලපත්‍ර වැනි ආදායම් ක්ෂේත්‍රයේදි එකතු කර තිබුණි.

2.3.2 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් බදු හිඟය රු.3,972,784 ක් වූ අතර වාර්ෂික බිල්කිරීම් රු.1,896,116 ක් විය. 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 32-42 දක්වා වූ රීතින් ප්‍රකාරව කාර්තු පදනම් කරගෙන හිඟ ලැයිස්තු සකස් කර, අදාල නිවේදන නිකුත් කිරීමෙන් පසු දේපල තහනමට ගෙන හිඟ වරිපනම් බදු අයකිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කල යුතු වුවද, සභාව විසින් එසේ කටයුතු කර නොතිබුණි.

2.3.3 කඩකුලී

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). සභාවට අයත් කුඹුක්ගැටේ උපකාර්යාල බල ප්‍රදේශයේ සභාව විසින් 2007, 2008 වර්ෂවල ඉදිකර තිබුණු පදික කඩ 07 ක් වර්තමානය වන විට බදුකරුවන් විසින් ස්ථිර ගොඩනැගිලි බවට පත්කරගෙන තිබුණි. සභාව විසින් අනවසර ඉදිකිරීම් පිළිබඳව සොයා බලා නොතිබුණි.

(ආ). ගොකරැල්ල උපකාර්යාල බල ප්‍රදේශයට අයත් "කොස්කැලේ තුරු සෙවන" නම් වූ ඉඩමෙහි ඉදිකර තිබුණු කඩ කාමර 30 න් මාසිකව රු.900 ක කුලියක් අයකරමින් පැවතුණි. එම කඩවල වාර්ෂික කුලිය රු.324,000 ක් විය. සභාවේ උපකාර්යාල විසින් අදාල කුලී සඳහා බිල් කිරීමක් සිදුකර නොතිබුණ අතර, අයවූ කුලිය පමණක් සටහන් කර තිබුණි. මේ හේතුවෙන් යම් නිශ්චිත දිනකට බිල්කිරීම්, අයවීම් හා හිඟ කුලී යනාදිය පිළිබඳ තොරතුරු පරික්ෂා කිරීමට නොහැකිවී තිබුණි. 2012 හා 2013 වර්ෂයන්ට අදාලව පිළිවෙලින් රු.221,100 ක හා රු.129,600 ක හිඟයක් තිබුණි.

2.3.4 පෙර ගෙවුම් මුදල්

මැල්සිරිපුර බස්නැවතුම්පොලේ ඉදිකර තිබුණු කඩ කාමර 4 ක් හා ඉදිකිරීමට යෝජිත කඩ කාමර 3 ක් පෙර ගෙවුම් ක්‍රමයට බදුදීම සඳහා 2013 අප්‍රේල් 08 දින රු.8,565,263 ක අවම ලංසුවකට මිල ගණන් කැඳවා තිබුණි. මෙම කඩ හත එකතු වටිනාකම රු.8,565,859 ක මුදලකට ටෙන්ඩර් වී තිබුණද, අංක 07 දරන කඩ කාමරය වෙනුවෙන් පමණක් රු.300,000 ක් අයවී තිබුණි. මේ අනුව ටෙන්ඩර් වූ මුදලින් රු.8,265,859 ක් හිඟව පැවති අතර කලින් ඉදිකර තිබුණු කඩ කාමර 04 සඳහා කුලී මුදල් බිල් කිරීමක් හෝ ඉදිකිරීමට යෝජිත කඩ 3 ඉදිකිරීමක් හෝ සිදුව නොතිබුණි. මෙලෙස අදාල ටෙන්ඩර් කොන්දේසි ප්‍රකාරව මුදල් නොගෙවන අය සම්බන්ධව සභාව විසින් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.3.5 ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු

සභා බල ප්‍රදේශය තුල සමීක්ෂණයක් පවත්වා කර්මාන්ත හා වෙළඳ ව්‍යාපාර පිළිබඳව ලැයිස්තුවක් පිළියෙල කර ලේකම්වරයා වෙත ඉදිරිපත් කර සභාව විසින් පනවන ලද බද්ද කර්මාන්ත හිමියන් හා වෙළඳ ව්‍යාපාරිකයන් විසින් දින 7 ක් ඇතුලත ගෙවන ලෙස නිවේදනය කර නොතිබුණි.

2.3.6 ජල ආදායම්

හිරිපිටිය උපකාර්යාල බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක ජල ව්‍යාපෘතිය මගින් ජල පාරිභෝගිකයින් 122 කට ජලය සැපයීම සිදුකර තිබූ අතර, ජල ටැංකි වලට සැපයෙන ජලය හා ටැංකියෙන් පිටවන ජලය ප්‍රමාණය හඳුනා ගැනීම සඳහා ජල මීටර් නොතිබීම නිසා බෙදාහැරි ජල ඒකක හා බිල්කල ජල ඒකක ගණන පිළිබඳව සැසඳීමක් සිදුකල නොහැකි විය. සමාලෝචිත වර්ෂය තුල ජල බිල් කිරීම රු.596,983 ක් වූ අතර, 2013 දෙසැම්බර් 31 ට හිඟය රු.116,488 ක් විය. එකී හිඟය තුල රෝහලට ජලය සැපයීම සඳහා වූ රු.72,642 ක හිඟයක්ද පැවතිණි.

2.3.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ ප්‍රමාණය රු.501,958 ක් විය.

2.3.8 දුරකථන සම්ප්‍රේෂණ කුළුණු ගාස්තු

සභා බල ප්‍රදේශය තුල අනුමත කර ඇති දුරකථන සම්ප්‍රේෂණ කුළුණු සංඛ්‍යාව 18 ක් වූ අතර 2011, 2012 හා 2013 වර්ෂ සඳහා අයවිය යුතු ගාස්තු පිළිවෙලින් රු.228,500, රු.227,715 හා රු.222,375 ක් වුවද, එම ගාස්තු අයකර නොතිබුණි.

2.3.9 මස්කඩ බදු

අවම ලංසුව රු.451,100 බැගින් ටෙන්ඩර් කර තිබූ මැල්සිරිපුර සතිපොල එළහරක් මස් කඩය, මස්/මාළු කඩ මූලික පිරිවිතර වලට අනුකූල නොවීම හේතුවෙන් 2011 වර්ෂයේ සිට ටෙන්ඩර් වී නොතිබුණි. මේ හේතුවෙන් අවම ලංසුව සමඟ සැලකූවිට සභාවට උපයාගත හැකිව තිබූ රු.1,353,300 ක පමණ ආදායමක් අහිමි වී තිබුණි.

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

සභාව විසින් සමාලෝචිත වර්ෂය තුල ඉටුකිරීමට සැලසුම් කර තිබූ රු.1,075,000 ක් වටිනා සුභසාධන කාර්යයන් 05 ක් ප්‍රමාණාත්මකව ඉටුකර නොතිබුණ අතර, රු.1,800,000 ක ප්‍රතිපාදන මත ඉටුකිරීමට සැලසුම් කර තිබූ සුභසාධන කාර්යයන් 08 ක් සම්පූර්ණයෙන්ම ඉටුකර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සභාව විසින් 2009 - 2011 කාලය තුල අනුමත කල ගොඩනැගිලි අයදුම්පත් 560 ක් තිබුණද, අනුකූලතා සහතික 29 ක් පමණක් ලබාදී තිබුණි .අයදුම්පත් 531 ක් සඳහා අනුකූලතා සහතික ලබා නොගැනීම හෝ ගොඩනැගිලි බලපත්‍ර කාලය දීර්ඝ කරවා නොගැනීම පිළිබඳව සභාව ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. එම ගොඩනැගිලි සියල්ල ඉදිකර තිබුණි නම් සභා අතුරු ව්‍යවස්ථා අනුව රු.106,200 ක ගොඩනැගිලි අනුකූලතා සහතික පත් ආදායමක් උපයාගතහැකිව තිබූ අතර, ගොඩනැගිලි බලපත්‍ර කාලය දීර්ඝ කරවාගැනීමට අදාල ගාස්තු පිළිබඳව විධිවිධාන ඇති කරගෙන නොතිබුණි.

(ආ). 2000 වර්ෂයේදී පමණ කට්ටි කර විකුණා තිබූ 'ගනේවත්ත උඩුවැල්ලැපිටිය' නැමති ඉඩමෙන් පර්චස් 15 ක පමණ ඉඩම් කොටසක් සභාවට පැවරීමට කටයුතු කරන බව දන්වා තිබුණද, එම ඉඩම් කොටස සඳහා ඔප්පුවක් ලබාගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. වර්තමානය වන විට එම ඉඩම් කොටසෙහි බාහිර පුද්ගලයකු අනවසරයෙන් පදිංචිව ඇති බව නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයට අයිතිය බදුදීම් යටතේ කුඹුක්ගැටේ ප්‍රදේශයේ මාළු ලැල්ලක් පවත්වාගෙන යාමට ඉදිරිපත්ව තිබූ රු.61,200 ක ටෙන්ඩරය පිළිගෙන තිබූ අතර, එය 2012 ඔක්තෝබර් 15 දින බදුකරුට දැනුම් දී තිබුණද, බදුකරු සමඟ සභාව ගිවිසුමකට එළඹ නොතිබුණි. අදාල බදු මුදල් අයකරගෙන නොතිබුණි. එහෙත් කුඹුක්ගැටේ පැවති, මාසික කුලිය රු.900 බැගින් වූ සභාවට අයත් පදික කඩ දෙකක එම මාළු ලැල්ල පවත්වාගෙන ගොස් ඇති බව අනාවරණය වී තිබුණද, ඒ පිළිබඳව සභාව විසින් කිසිදු

ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. එමෙන්ම 2013 අප්‍රේල් 09 දිනැති සභා තීරණ අංක 4(13)1 පරිදි කුඹුක්ගැටේ ප්‍රදේශයේ මාළු ලැල්ලක් පවත්වාගෙන යාම ටෙන්ඩර් නොකිරීමටත්, පදික කඩ අංක 1 හා 2 යන ස්ථානයේ මාළු වෙළදාම කරගෙන යාමටත් අවසර දී තිබුණි.

3.3 <u>සභාව විසින් පවරා ඇති නඩු</u>

(අ) හිරිපිටිය එළහරක් මස් කඩය වෙනුවෙන් 2008 වර්ෂය සඳහා අයවිය යුතුව පැවති රු.97,018 ක හිඟය සඳහා දේපල තහනම් කර මුදල් අයකිරීමට අංක 2011/8/5/11858/M නඩුවෙන් තීන්දු දී ඇති බව නඩු ලේඛනයේ දක්වා තිබුණද, අදාල මුදල් අයවූ බව නිරීක්ෂණය නොවූ අතර අදාල නඩු ලිපි ගොනුවද විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) හිරිපිටිය මාළු කඩය වෙනුවෙන් 2008 වර්ෂය සඳහා අයවිය යුතුව පැවති රු.113,912 ක හිඟය අයකර ගැනීම සඳහා වූ අංක 2011/8/5/11803/M නඩුව සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිරවුල් වී නොතිබූ අතර ඊට නිශ්චිත හේතුවක් නඩු ලේඛනය අනුව නිරීක්ෂණය නොවීය.

(ඇ) මැල්සිරිපුර සතිපොළහි 2005 හා 2006 වර්ෂයන්ට අදාලව අයවිය යුතු හිඟයන් අයකර ගැනීම සඳහා වූ අංක 2010/9/27/10509/M හා අංක: 2010/9/27/10521 දරන නඩුවලට අදාලව දේපල තහනම් කර මුදල් අයකර ගැනීමට තීන්දු දී ඇති බවට නඩු ලේඛනවල සඳහන් වුවද අදාල හිඟ වටිනාකම් අයකර ගැනීම හෝ නඩු තීන්දු ප්‍රකාර ගෙන ඇති ඉදිරි ක්‍රියා මාර්ග හඳුනාගත නොහැකි විය.

3.4 <u>අවිධිමත් ගනුදෙනු</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් ලද රු.1,000,000 ප්‍රතිපාදන යටතේ සභාව විසින් පෙර පාසල් උපකරණ මිලදී ගැනීමේදී අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ ආයතනයේ මිල ගණන් ප්‍රතික්ෂේප කර වැඩි මිලක් ලබාදී තිබූ ආයතනයේ භාණ්ඩ ගුණාත්මක බවින් යුතු බව සඳහන් කර එම ආයතනයෙන් භාණ්ඩ මිලදී ගැනීමට සභාව නිර්දේශ කර තිබුණි .මේ හේතුවෙන් සභාවට රු 197,600.ක් අවම මිලට වඩා වැඩියෙන් ගෙවීමට සිදුව තිබුණි.

(ආ). ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ xiv වැනි පරිච්ඡේදයේ 4.3 වගන්තිය ප්‍රකාරව නාගරික බල මණ්ඩලයක සීමාව ඇතුලතම කරන ගමන් බිමන් වෙනුවෙන් සංයුක්ත දීමනාව ගෙවිය නොහැකි වුවද, සභා තීරණයක් මගින් මසකට සම්පූර්ණ දින 15 ක් හෝ දිනකට අඩක් බැගින් දින 30 ක් සඳහාම සංයුක්ත දීමනා ලබාදීමට අවකාශ ලබාදී තිබුණි. ඒ අනුව සභාවේ රියදුරන් 07 දෙනෙකු විසින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල රාජකාරි ඉටු කලද, රු.175 ක් බැගින් වූ අර්ධ සංයුක්ත දීමනාව මසකට දින 30 සඳහාම ලබාගෙන තිබුණි. එලෙස 2013 වර්ෂය තුල සභාව විසින් රියදුරන්ගේ සංයුක්ත දීමනා ලෙස රු.207,101 ක් ගෙවා තිබුණි.

3.5 <u>ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම</u>

මයිලමඩම ජල ව්‍යාපෘතියට අදාලව 2011 වර්ෂයේදී රු.487,486 ක් වැයකර ජල මෝටර කුටිය හා ජල ටැංකි සඳහා කුළුණු සැකසීම නිමකර තිබුණද, ව්‍යාපෘතියේ අනෙකුත් වැඩ නිමකර ප්‍රදේශයේ ජනතාව වෙත ජලය සැපයීම ආරම්භ කර නොතිබුණි.

3.6 <u>ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය</u>

සභා බල ප්‍රදේශයේ එකතුවන කසල සම්බන්ධයෙන් කසල කළමනාකරණ ව්‍යාපෘතියක් ඉදිකිරීමට අවශ්‍ය බිම් කොටසක් සභාව විසින් හඳුනාගෙන නොතිබූ අතර කසල වළ දැමීමේ ක්‍රමයක් සභාව අනුගමනය කර තිබුණි.

04. <u>ගිණුම් කටයුතු භාවය හා යහපාලනය</u>

4.1 <u>අයවැය පාලනය</u>

පුනරාවර්තන වැය විෂයයන් 3 ක් යටතේ රු.11,004,000 ක ඉක්මවීම් පැවති අතර, ප්‍රාග්ධන වියදම් යටතේ රු.3,296,000 ක ප්‍රතිපාදන ඉක්මවා වැයකර තිබුණි. එමෙන්ම සභාවේ උත්පාදිත ආදායම් යටතේ ඇස්තමේන්තුගත ආදායම රු.19,025,000 ක් වූ අතර තථ්‍ය ආදායම රු.12,663,000 ක් විය.

05. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලබේ.

(අ). ගිණුම්කරණය
(ආ). ආදායම් පරිපාලනය
(ඇ). වත්කම් කළමනාකරණය
(ඈ). මූල්‍ය පාලනය
(ඉ). අයවැය පාලනය
(ඊ). කොන්ත්‍රාත් පරිපාලනය